මාගේ සමූහයා විසින් සිදුවන අත්වැරදීම්, අමතක වීම් හා ඔවුනට බලහත්කාරයෙන් කිරීමට සිදු වූ දෑට අල්ලාහ් මා වෙනුවෙන් ඔවුනට සමාව දී ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "මාගේ සමූහයා විසින්
සිදුවන අත්වැරදීම්, අමතක වීම් හා ඔවුනට බලහත්කාරයෙන් කිරීමට සිදු වූ දෑට අල්ලාහ් මා වෙනුවෙන් ඔවුනට සමාව දී ඇත."
[قال النووي: حديث حسن] [رواه ابن ماجه والبيهقي وغيرهما]

සැබැවින්ම අල්ලාහ් තම සමූහයාගෙන් අවස්ථා තුනක දී ඔවුන් සිදු කරන කරුණු නොසළකා හරින බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියේය. පළමුවැන්න: අත්වැරදීම්, එනම් කිසිදු උවමනාවකින් (චේතනාවකින්) තොරව ඔවුන් විසින් සිදු වන දෑ, එනම් මුස්ලිම්වරයකු යම් ක්රියාවක් සිදු කරන්නට අපේක්ෂා කර එම ක්රියාව ඔහු අපේක්ෂා කළ දෑට පටහැනිව සිදු වීමය. දෙවැන්න: අමතක වීම්: එනම් මුස්ලිම්වරයකුට යමක් මතකයෙන් සිදු කළ යුතුව තිබී නමුත් එම ක්රියාව සිදු කරන අවස්ථාවේ ඔහුට එය අමතක වී යාමය. එවිට ඒ සඳහා පවක් ඔහුට හිමි වන්නේ නැත. තුන්වැන්න: බලකරනු ලැබීම: ගැත්තෙකු තමන් අකැමැති ක්රියාවක් එය ඔහුට වැළැක්වීමට හැකියාවක් නොමැතිව සිදු කිරීමට බල කරනු ලබන්නේ නම්, එවිට ද ඔහු කෙරෙහි පාපයක් හෝ වරදක් හෝ හිමි වන්නේ නැත. ගැත්තා හා ඔහුගේ පරමාධිපතියාණන් අතර පවතින තහනම් කරන ලද කටයුතු පිළිබඳව සැළකීමේ දී මෙම හදීසයේ සඳහන් කරුණු සැළකිල්ලට ගනිමින්, අමතක වීම හේතුවෙන් නියෝග කරනු ලැබූ දෙයක් මඟ හැරුණු විටෙක ඔහු එම වගකීමෙන් බැහැර වන්නේ නැත. ඔහුගේ ක්රියාව අපරාධයකට හේතු වුවහොත් මැවීම් සඳහා වන වගකීම ද ඉවත් වන්නේ නැත. එය වැරදීමකින් කෙනෙකු ඝාතනය වූ විටෙක වැරැද්ද සිදු කළ පුද්ගලයා විසින් වන්දි පිරිනැමීම හෝ වැරදීමකින් වාහනයක් විනාශයට පත් වූ විටෙක එහි වගකීම විනාශ කළ පුද්ගලයා විසින් දරන්නාක් මෙනි.

http://sunnah.global/hadeeth/si/show/4216